# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No } 10120

ෆැක්ස් / தொலைநகல / Fax } 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone } 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site } www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail } dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO } 900 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No } / 2024

දිනය / திக / Date } 28/05/2024 පැය 1600

## මාධ්‍ය නිවේදනය

**01. අයිස් මත් ද්‍රව්‍ය හා ටී කටස් වර්ගයේ ගිනි අවියක් , ජීව උණ්ඩ සමගින් සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.05.27 වන දින රාත්‍රී කාලයේදී මෝදර පොලිස් වසමේ ඉබ්බගෙවත්ත හන්දිය ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර අයිස් මත් ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම්390ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත් අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන කිඹුලාවල කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරුගෙන් කරන ලද ප්‍රශ්න කිරීමේදී අනාවරණය වූ තොරතුරු අනුව සැකකරුගේ නිවසේ මල් පෝච්චියක් යට වළදමා තිබියදී මෙරට නිශ්පාදිත ටී කටස් වර්ගයේ ගිනි අවියක් හා ටී 56 වර්ගයේ උණ්ඩ 10ක් පොලිස් භාරයට ගෙන ඇත.

2022.06.06 වන දින මෝදර පොලිස් වසමේ ඉබ්බගෙවත්ත හන්දිය අසලදී ත්‍රිරෝද රථයකින් පැමිණි පුද්ගලයින් දෙදෙනෙකු විසින් වෙඩි තබා පුද්ගලයෙකු ඝාතනය කිරීමේ සිද්ධියට සම්බන්ධව එම ත්‍රිරෝද රථයේ පැදිකරු මෙම අත් අඩංගුවට ගන්නා ලද සැකකරු බවට මෝදර පොලිසිය මගින් අනාවරණය කරගෙන තිබිණි. කොළඹ අපරාධ කොට්ඨාශය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මත්පෙති සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.05.27 වන දින සවස් කාලයේ බ්ලූමැන්ඩල් පොලිස් වසමේ වදුල්ලවත්ත ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **PREGAB වර්යේ මත්පෙති 100 ක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 19 ක් වන කොළඹ 13 ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

කොළඹ අපරාධ කොට්ඨාශය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.05.27 වන දින සවස් කාලයේ නාරාහේන්පිට පොලිස් වසමේ කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 300 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන වැලිගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාශය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**